අ.පො.ස උසස් පෙළ

# දේශපාලන විද්‍යාව



දේශපාලනය, සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස අර්ථකතනය කරයි.

නිපුනතා මට්ටම :-

දේශපාලනය, සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයක් ලෙස අර්ථකතනය කරයි.

ඉගෙනුම් ඵල:-

දේශපාලනය හා දේශපාලන විද්‍යාව අර්ථකථනය කරයි.

විෂය අන්තර්ගතය :-

### 1.1.දේශපාලන විද්‍යාව හඳුනාගැනීම

**දේශපාලන විද්‍යාව යනු කුමක් ද?**

## දේශපාලන විද්‍යාව හා දේශපාලනය අතර පවතින වෙනස්කම්

දේශපාලනය යනු දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ දේශපාලන බල අරගලය ක්‍රියාවට නැංවෙන ප්‍රායෝගික ක්‍රියාදාමය ලෙස හැඳින්විය හැකිය.මේ සම්බන්ධයෙන් වැදගත් වන්නේ දේශපාලන බල අරගලය සමඟ සෘජුවම සම්බන්ධ දේශපාලඥයින්ගේ සහ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරකම් ය.




The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




දේශපාලන ක්‍රමයක් මුහුණ දී තිබෙන

- දේශපාලන
- ආර්ථික
- සමාජ ප්‍රශ්න විසඳීම සඳහා කුමක් කළ යුතුද
  යන්න  සම්බන්ධයෙන්,

- දේශපාලන පක්ෂ හා
- දේශපාලඥයින් ඉදිරිපත් කරන විසඳුම් හා ක්‍රියාකාරකම් අතර පවතින
  වෙනස හේතුකොට ගෙන දේශපාලනය පැන නගී.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

**දේශපාලනය ගැන කථා කිරීමේ දී වැදගත් වන්නේ,**

- දේශපාලන ක්‍රමයක් මුහුණ දී ඇති ප්‍රශ්න
- දේශපාලන පක්ෂ දේශපාලඥයින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය විසඳුම්
- එම ප්‍රතිපත්තිමය විසඳුම් අතර පවතින වෙනස්කම්
- බල අරගලය තුළින් ඒවා ක්‍රියාවට නැංවීමට දරණ උත්සාහය
- දේශපාලනයේ පදනම වන්නේ ඉහත කරුණු ය.

**දේශපාලන ක්‍රමයන් මුහුණ දී තිබෙන**

- දේශපාලන
- ආර්ථික
- සමාජ ප්‍රශ්න

**දේශපාලන පක්ෂ,**

**ඉන්දියාව**
**ඇමෙරිකාව**








Copyright © e-thaksalawa.moe.gov.lk

## ශ්‍රී ලංකාව




## දේශපාලඥයින්



## බල අරගලය




The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk


ඉහත ආකාරයට දේශපාලන ක්‍රමයක් මුහුණ දී ඇති ප්‍රශ්න සහ ගැටළු, දේශපාලන පක්ෂ , දේශපාලඥයින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය විසඳුම්,එම ප්‍රතිපත්තිමය විසඳුම් අතර පවතින වෙනස්කම් බල අරගලය තුළින් ඒවා ක්‍රියාවට නැංවීමට දරණ උත්සාහය දේශපාලනයේ පදනම වේ.

**දේශපාලන විද්‍යාව යනු දේශපාලන වශයෙන් සංවිධානය වූ මිනිස් සමාජයක් තුළ මිනිසුන්ගේ පොදු යහපත ගොඩනැගීම හා මර්ධනය උදෙසා කුමක් කෙසේ කළ යුතුද යන්න විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නාවූ විෂය වේ.**

වෙනත් ලෙසට පවසනවා නම් **දේශපාලන විද්‍යාව යනු රාජ්‍යය , ආණ්ඩුව සහ ජනතාව යනමූලික ඒකක තුන අතර පවත්නා සම්බන්ධතාවයන්ගේ ස්වරූපය සහ ජනතාවගේ පොදු යහපත උදෙසා වඩාත්ම උචිත වන්නේ කුමන රාජ්‍ය ක්‍රමයක් ද ,කුමන ආණ්ඩු ක්‍රමයක් ද සහ කුමන දේශපාලන හා ආර්ථික මතවාදයක් ද යන්න පිළිබඳව විද්‍යාත්මකව අධ්‍යයනය කරන්නා වූ විෂය** ලෙස හඳුන්වා දිය හැකිය.මේ අනුව දේශපාලන විද්‍යාව ගැන කතා කිරීමේ දී වැදගත් වන්නේ,

- දේශපාලන දාර්ශනිකයින්
- දේශපාලන විද්‍යාඥයින්
- දේශපාලන මතවාද
- දේශපාලන න්‍යායන්



The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk





ඇරිස්ටෝටල්

රූසෝ







ප්ලේටෝ


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

දේශපාලන මතවාද හා න්‍යායන් ලැයිස්තුවක් ලෙස පහත ආකාරයට දැක්විය හැකිය.

- ලිබරල්වාදය
- පැසිස්ට්වාදය
- සමාජවාදය
- ස්වාධිපතිවාදය
- ව්‍යවස්ථානුකූලවාදය
- විකාශනාත්මක වාදය

ආදී ලෙස.

## දේශපාලනය පිළිබඳ වැඩි දුර දැනුම සඳහා

දේශපාලනය යන පදය ප්‍රථමයෙන්ම භාවිතයට ගනු ලැබුයේ ග්‍රීක දේශපාලන දාර්ශනිකයෙකු වූ ඇරිස්ටෝටල් විසිනි.ඔහු විසින් රචිත ග්‍රන්ථය "දේශපාලනය" වේ.



Polis යන ග්‍රීක පදය මේ සඳහා යොදාගත් අතර එයින් අර්ථවත් වූයේ සමකාලීනව පැවති ග්‍රීක නාගරික රාජ්‍ය පිළිබඳව අධ්‍යයනය කරමින් වඩාත් හොඳ රාජ්‍ය ක්‍රමය ආණ්ඩු ක්‍රමය කුමක් ද යන්න සොයා බැලීම යි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk




මෙලෙස ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමයේ දේශපාලනය අධ්‍යයනය කිරීම තුළින් **දේශපාලන විද්‍යාව** විෂය ආරම්භ විය.

මෙයින් පෙනී යන්නේ ආරම්භක අවස්ථාවේ දී , එනම් ග්‍රීක යුගයේ දී දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර පැහැදිලි වෙනස්කමක් නොතිබුණු බවයි

**ග්‍රීක යුගය**

**දේශපාලනය = දේශපාලන විද්‍යාව**

දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර පැහැදිලිව වෙනස්කමක් දක්නට ලැබෙන්නේ,


e තක්සලාව
The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

- නව යුගයේ ජාතික රාජ්‍යය බිහිවීමත්
- ඒ ආශ්‍රිතව ජාතික සහ අන්තර් ජාතික ක්ෂේත්‍ර යේ ඇතිවන බල අරගලයත්

හේතුකොට ගෙන දේශපාලනය හා දේශපාලන විද්‍යාව යන පද දෙක භාවිතයට ලැබීමේ වෙනස්කම් ඇතිවන ආකාරය දැකිය හැකිය.

මේ අනුව දේශපාලනය යන පදය දේශපාලන ක්‍රීඩාවේ ප්‍රායෝගික පැත්ත හැඳින්වීම සඳහා භාවිතයට ගැනෙන අතර දේශපාලන විද්‍යාව යනු දේශපාලනයේ න්‍යායාත්මක පැත්ත විද්‍යාත්මකව අධ්‍යයනය කැන විෂය හැඳින්වීම සඳහා භාවිතයට ගන්නා අයුරු දැකිය හැකිය.







Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

**මේ අනුව ,**

වර්තමානයේ දේශපාලනය යන පදයෙන් අදහස් වන්නේ දේශපාලන බල අරගලය හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාදාමය යි.වෙනත් ආකාරයකට කියතොත් දේශපාලන බලය සහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර පවත්නා අරගලයයි.

බල අරගලය දෙයාකාර ස්වරූපයක් ගනී.




දේශපාලනය ජාතික වුවද අන්තර්ජාතික වුවද දේශපාලනය වු කලී බලය සහා කෙරෙන අරගලය වේ.

බල අරගලයේ අරමුණු :-

- බලය අල්ලා ගැනීම.
- බලය තහවුරු කර ගැනීම.
- බලය ව්‍යාප්ත කර ගැනීම.

අන්තර්ජාතික දේශපාලනය තුළ බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවා වන්නේ
නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් ය.

දේශීය දේශපාලනය තුළ බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවන් වන්නේ,

- දේශපාලන පක්ෂ හා
- දේශපාලඥයින් ය.


Copyright © e-thaksalawa.moe.gov.lk

දේශීය වුව ද , අන්තර්ජාතික වුව ද,දේශපාලනය පැන නැගීමට පදනම් වන හේතු සාධක ප්‍රධාන වශයෙන් කොටස් දෙකකි.

1.දේශපාලන සමාජය මුහුණ දෙන දේශපාලන ආර්ථික හා සමාජ ගැටළු විසඳීම සඳහා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් විසින් ඉදිරිපත් කැන ලද ප්‍රතිපත්තිමය විසඳුම් අතර පවතින පරස්පරතාවයන්

2. තමන්ගේ මතය හෝ ප්‍රතිපත්ති වඩාත් නිවැරදිය යන විශ්වාසය පදනම් නොට ගෙන එම ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ප්‍රතිවිරුද්ධ දේශපාලනඥයින් රාජ්‍ය බලය අල්ලා ගැනීමට තරඟ වැදීම

මේ අනුව පෙනී යන්නේ,

**දේශපාලනය** යනු,

<u>විවිධත්වය තුළින් පැන නගින ප්‍රතිවිරුද්ධතාවන් මත හට ගන්නා බල අරගලය වන බවයි.මෙයින් පැහැදිලි වන දෙය වන්නේ,</u>

- දේශපාලනය වූ කලී,
- ප්‍රතිවිරුද්ධ මතවාද

දේශපාලන ක්‍රියාකාරකම් නොමැති තැනක සැබෑ දේශපාලනයක් පැවතිය නොහැකි බවයි. දේශපාලනය වූ කලී ප්‍රතිවිරුද්ධ තත්වයක් අතර ගැටීම තුළින් පැන නගින දෙයක් වන අතර එය ප්‍රත්‍යක්ෂ මූලික සාදක පදනම් කරගත් කලාවක් වේ.

දේශපාලන සමාජයක් තුළ

- බල අරගලය කෙරෙන්නාවූ ආකාරය සහ
- ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර බලය බෙදා හදා ගන්නා ආකාරය

පිළිබිඹු වන්නේ දේශපාලනය මගිනි.


Copyright © e-thaksalawa.moe.gov.lk
The National e-learning Portal for The General Education

## දේශපාලන විද්‍යාව පිළිබඳ වැඩිදුර දැනුම සඳහා


මීට පෙර සඳහන් කළ පරිදිම,තව දුරටත් පැහැදිලි කරනවා නම්,

- දේශපාලනය හා එහි ක්‍රියාකාරීත්වය
- ඒ කෙරෙහි පදනම් වී ඇති දේශපාලන හා ආර්ථික මතවාද
- අවසාන වශයෙන් දේශපාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වය තුළින් ජනතාවට වන බලපෑම

විද්‍යාත්මකව අධ්‍යයනය කරන විෂය වේ.

දේශපාලන විද්‍යාව අවුරුදු තුන් දහසකට ආසන්න කාලයක් මුළුල්ලේ අනුක්‍රමයෙන් විකාශනය වූ දෙයක් වන අතර එම විකාශන ක්‍රියාදාමය තුළ කාලීනව ජීවත් වූ දේශපාලන දාර්ශනිකයින් හා විශේෂඥයින් විසින් සමකාලීනව පැවති දේශපාලන ක්‍රම හා දේශපාලන සංසිද්ධීන් සම්බන්ධව ඉදිරිපත් කළ පුළුල් අදහස් සම්භාරයකින් එය සමන්විත වේ.

එම පුළුල් අදහස් සම්භාරය කොටස් හතරකට බෙදිය හැකිය.







The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## (1)දේශපාලන න්‍යාය

දේශපාලන න්‍යායක් වෙනුවෙන් අදහස් කරන්නේ ප්‍රත්‍යක්ෂ මූලික දත්ත සහ සාධක පදනම් කරගෙන දේශපාලන ආයතන වල ක්‍රියාකාරීත්වය හා සම්බන්ධව ගොඩනැගී ඇති මුලධර්මයන් ය.

## (2)දේශපාලන චින්තනය

දේශපාලන චින්තනය යනුවෙන් අදහස් කරන්නේ දේශපාගන ක්‍රමයක සමස්ථ ක්‍රියාකාරීත්වය සහඑයින් දේශපාලන ජීවිතයට වන බලපෑම පිළිබඳ ව ඒ ඒ කාලයන් හි ජීවත් වූ දේශපාලන චින්තකයින් විසින් ඉදිරිපත් කර ඇති අදහස්ය.

**ඇරිස්ටෝටල්** **ප්ලේටෝ** **සොක්‍රටීස්**

## (3) දේශපාලන දර්ශනය :-

දේශපාලන දර්ශනය ගොඩනැගී තිබෙන්නේ පරමාදර්ශ රාජ්‍ය පාලන ක්‍රමයක් පිළිබදව දේශපාලන දාර්ශනිකයින් ඉදිරිපත් කර ඇති අදහස් පදනම් කරගෙනය.

උදා :-

- ප්ලේටෝ ගේ පරමාදර්ශී රාජ්‍ය ක්‍රම
- තෝමස් මුවර්ගේ උටෝපියා රාජ්‍යය
- කාල් මාක්ස්ගේ සංවර්ධිත කොමියුනිස්ට් රාජ්‍යය


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## (4) දේශපාලන මතවාද

දේශපාලන මතවාද යන්නෙන් අදහස් කරන්නේ ජීවිතය , සමාජය සහ ආණ්ඩුව පිළිබඳව සමස්ථ සමාජය විසින් හෝ පුද්ගල කණ්ඩායමක් විසින් හෝ දේශපාලන පක්ෂයක් විසින් පිළිගෙන ඇති ඒකීය අදහස් මාලාවක් ය.

- ❖ දේශපාලන න්‍යාය
- ❖ දේශපාලන චින්තනය
- ❖ දේශපාලන දර්ශනය
- ❖ දේශපාලන මතවාද

යන කොටස් තුනෙහි පැහැදිලි වෙනසක් දඅකිය නොහැකි බව විචාරක මතයයි.හේතුව විෂය මූලික කරුණු අතින් එම කොටස් තුන අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවක් පැවතීමයි.


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

## ඇගයීම

(I) දේශපාලනය යන්න කෙටියෙන් හඳුන්වන්න.

(II) දේශපාලනය පිළිබඳව කතා කිරීමේ දී වැදගත් වන කරුණු 5ක් ලියන්න.

(III) දේශපාලන විද්‍යාව කෙටියෙන් හඳුන්වන්න.

(IV) දේශපාලන විද්‍යාව පිළිබඳව කතා කිරීමේ දී වැදගත් වන කරුණු 4 ක් ලියන්න.

(V) දේශපාලන දාර්ශනිකයින් තිදෙනෙකුගේ නම් ලියන්න.

(VI) දේශපාලන මතවාද 6ක් ලියන්න.

(VII) දේශපාලනය යන පදය ප්‍රථමයෙන් ම භාවිතයට ගනු ලැබූ දේශපාලන චින්තකයා නම් කර ඔහු විසින් රචිත ග්‍රන්ථය නම් කරන්න.

(VIII) දේශපාලන බල අරගලයේ දෙයාකාර ස්වරූප මොනවාද?

(IX) දේශීය දේශපාලනය තුළ බල අරගලයේ ප්‍රධාන රැඟුම්කරුවන් දෙදෙනෙක් නම් කරන්න.

(X) අන්තර්ජාතික දේශපාලනය තුළ බලා අරගලයේ ප්‍රධාන රැඟුම්කරුවා කවුද?


The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk

The National e-learning Portal for The General Education
Copyright © e-thaksalawa.moe.gov.lk